**ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය අදියර II (එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය) - 2018**

---

ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතියේ අදියර II (එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා හොංකොං සහ ෂැන්හායි බැංකු සමාගම අතර 2013 ජුනි 21 දින එළඹි අංක 53එම්/එෆ්සී/1448(201327/එස්එල්) දරන ණය ගිවිසුමේ 01 කොන්දේසිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය.

ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ග්‍රාමීය පාලම් 104 ක් සැලසුම් කිරීම, මැනුම් කිරීම හා සැපයීම, තාක්ෂණික සහාය සහ පුහුණුව ලබා දීම ව්‍යාපෘතියේ අරමුණු වේ. පසුව ඉදිකිරීමට අපේක්ෂිත පාලම් සංඛ්‍යාව 2017 අගෝස්තු 28 දිනැති අංක 09 දරන කොන්ත්‍රාත් පැහැදිලි කිරීම් මගින් පාලම් 66 දක්වා අඩුකර තිබුණි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,275.13 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 88.72 ක් වූ අතර ඉන් රු.මිලියන 9,775.13 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 70.65 ක් සැපයීමට සීමාසහිත හොංකොං සහ ෂැන්හායි බැංකු සහයෝගීතා සමාගම එකඟ වී තිබුණි. රු.මිලියන 2,500 ක් වූ ඉතිරි ප්‍රමාණය ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 19 දින ආරම්භ කරන ලද අතර 2017 සැප්තැම්බර් 18 වන විට නිම කිරීමට නියමිතය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කටයුතු නිමවන දිනය 2018 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වා ගණනය කළ මතය.

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. ව්‍යාපෘතිය මඟින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු.**

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| රු.මිලියන 249.29 ක් වටිනා පාලම් කොටස් තොග මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කර තිබුණු අතර එය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි. | කෙරීගෙන යන සිවිල් වැඩ වටිනාකම වැඩියෙන් පෙන්නුම් කරයි | පිළිගෙන ඇත. | වෙනම ගිණුම්ගත කිරීම අවශ්‍ය වේ. |

**2.2 නොපියවන ලද ශේෂ.**

| විස්තරය | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගන්නා ලද රු.මිලියන 327 ක් වූ විශේෂ අත්තිකාරම් වටිනාකම 2018 දෙසැම්බර් 31 දින වන විට වසර 04 ක් තිස්සේ නොපියවා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සපයන ලද තොරතුරු වැරදි ලෙස අර්ථ දක්වා තිබුණි. | 2019 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලබාගන්නා ලද අරමුදල් උපයෝගී කරගෙන සම්පූර්ණයෙන් පියවනු ලැබේ. | ක්‍රියාත්මක කරන ආයතනය අතර පවතින ගිවිසුම පරිදි ගිණුම් ගැළපීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

විගණනය වෙත සපයන ලද තොරතුරු අනුව, 2017 සැප්තැම්බර් 16 වන විට සම්පූර්ණ කිරීමට මූලිකව සැලසුම් කර තිබුණු යකඩ පාලම් 66 න් 2018 දෙසැම්බර් 31 වන විට යකඩ පාලම් 60 ක ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර තිබුණි. පාලම් ඉදිකිරීම් වැඩවල මන්දගාමී ප්‍රගතිය නිසා ව්‍යාපෘතිය නිමවන දිනය 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, අනෙකුත් පාලම් ඉදිකරීම් වැඩවල භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දින වන විට සියයට 49 සිට සියයට 97 පරාසයක් තුළ පැවතුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය.**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ලැබී ඇති තොරතුරු අනුව, අදාළ කොන්ත්‍රාත් ගිවිසුමේ වගන්ති 03 ප්‍රකාරව, 2018 දෙසැම්බර් 31 දින වන විට දින 2,466 කට වඩා වැඩ සම්පූර්ණ කිරීමේ ප්‍රමාදය නිසා පාලම් 08 ක ඉදිකිරීමේ කටයුතුවල යෙදෙන කොන්ත්‍රාත්කරුවන්ගෙන් රු.මිලියන 59.06 ක් අයකර ගතයුතුව තිබුණි. ඉන් 2019 නොවැම්බර් 29 වන විට රු.මිලියන 9.5 ක් පමණක් අයකරගෙන තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත් ප්‍රතිපාදනවලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට මූල්‍ය ප්‍රතිලාභ ලබාගැනීමේ හැකියාව පවති. | තීරණාත්මක ඉදිකිරීම් කටයුතුවලදී කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් ඇති නොවන පරිදි සාධාරණ පදනමින් ප්‍රමාද දඩ මුදල් අඩු කර ගැනීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය පියවර ගෙන ඇත. | ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් වැඩ අධීක්ෂණය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |